කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය
සිව් වන වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (මාර්ගගත), දෙවන සෙමෙස්තරය - 2019/2020
GYG 4271– තුලනාත්මක ප්‍රාදේශීය අධ්‍යයන

විවෘත ග්‍රන්ථ ලිඛිත විභාගය (Open Book Examination)

විභාග අපේක්ෂකයින් සඳහා උපදෙස් මාලාව:

- **ප්‍රශ්න පත්‍රය ආරම්භ වන්නේ පිටු අංක 2 සිටය.**
- සියලුම ලිඛිත ඇගයීම් **අත් අකුරින් පමණක්** ලිවිය යුතුය. ඔබේ අත් අකුරු පැහැදිලි ව ලිවීමට වග බලා ගන්න.
- ඔබේ පිළිතුරු A4 ප්‍රමාණයේ කඩදාසියක ලියන්න (සීආර් කොළ හෝ ෆුල්ස්කැප් කොළ මේ සඳහා භාවිත කළ හැකි ය). පිළිතුරු ලිවීමේ දී **කළු බෝල් පොයින්ට් පෑනක්** භාවිත කිරීම සුදුසු වේ.
- සාමාන්‍ය පරීක්ෂණයකදී මෙන් ඔබේ පිළිතුරු පරිගණකගත කිරීමට හෝ යතුරු ලියනය කිරීමට **අවසර නොලැබේ.** නමුත් දෘශ්‍යාබාධිත සිසුන් වැනි විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් අවසර ලබා දී ඇති සිසුන් සඳහා මෙම නියමය අදාළ නොවේ.
- කරුණාකර ඔබේ **විභාග අංකය පිළිතුරු පත්‍රයේ සෑම පිටුවකම ඉහළ දකුණු කෙළවරේ සටහන් කරන්න**. පිළිතුරු පත්‍රයේ කිසිදු ස්ථානයක ඔබේ නම සඳහන් කිරීමෙන් වළකින්න.
- පහත දැක්වෙන ආකෘතිය භාවිත කර පිළිතුරු පත්‍රයේ පහළ **පිටු අංකනය කරන්න**: උදා. එය පිටු 5 කින් සමන්විත නම් 1/5, 2/5… ආදී වශයෙන්.
- ඔබේ පිළිතුරු පත්‍රයේ පළමු පිටුව ලෙස පොදු මුල් පිටුව (එය LMS මගින් ලබාගත හැකි ය.) භාවිත කරන්න. **අදාළ පොදු මුල් පිටුව මුද්‍රණය කිරීමෙන් හෝ අත් අකුරින් පිටපත් කිරීමෙන් හෝ ඔබට ලබා ගත හැකි වේ.**
- පිළිතුරු පත්‍රයේ මුළු පිටු ගණන ඔබේ පිළිතුරු පත්‍රයේ මුල් පිටුවේ සඳහන් කළ යුතු ය.
- පිළිතුරු පත්‍රයේ සියලු පිටු පිළිවෙලින් ඡායාරූපගත කර හෝ පරිලෝකනය (scan) කර එය **තනි PDF ගොනුවකට** පරිවර්තනය කරන්න. පරිලෝකනය කරන ලද රූපයේ සම්පූර්ණ පිටුවම නිසියාකාරව ආවරණය වී ඇති බවට වග බලා ගන්න.
- පිළිතුරු පත්‍රයේ පරිලෝකනය කළ රූපය පැහැදිලි / කියවිය හැකි බවට වග බලා ගන්න.
- **LMS වෙත තනි පිටු වෙන වෙනම උඩුගත කිරීමට ඉඩ නොදෙන බව සලකන්න.**
- **පිළිගත හැකි එකම ගොනු ආකෘතිය PDF වේ. අපේක්ෂකයාගේ විභාග අංකය PDF ගොනුවේ නාමය ලෙස භාවිත කළ යුතු ය. උදා. A 12345**
- ඔබගේ පිළිතුරු පත්‍රය **JPEG / JPG හෝ වෙනත් ගොනු වර්ගයකින්** උඩුගත කිරීමට ඔබට **අවසර නොලැබේ.**
- ඔබගේ පිළිතුරු පත්‍රයේ **අවසාන පිටපත පැය 24 ක් ඇතුළත LMS වෙත උඩුගත කිරීමට කටයුතු කරන්න**.
- ඔබගේ පිළිතුරු පත්‍රය නිසි ආකාරයට යොමු කළ බව සනාථ කරගැනීම සඳහා **'ඉදිරිපත් කරන ලදී (Submitted)'** යන වචනය සමඟ LMSහි සම්පූර්ණ පිටුවේ **තිර රූවක් (Screen shot) ගෙන සුරැකිව තබා ගන්නා ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ**.
- LMS වෙත පිළිතුරු පත්‍රයක් උඩුගත කිරීමේදී යම් අනපේක්ෂිත තාක්ෂණික ගැටලුවක් ඇති වේ නම්, ඔබගේ පිළිතුරු පත්‍රයේ පිටපත විද්‍යුත් තැපෑලෙන් exam4@arts.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට **දෙන ලද පැය 24 ඇතුළත** යැවිය හැකි ය.

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය
සිව් වන වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (මාර්ගගත), දෙවන සෙමෙස්තරය - 2019/2020

GYG 4271– තුලනාත්මක ප්‍රාදේශීය අධ්‍යයන

විවෘත ග්‍රන්ථ ලිඛිත විභාගය (Open Book Examination)

<u>කාලය</u>: **පැය 24 ක්** ඇතුළත පිළිතුරු පත්‍රය LMS වෙත උඩුගත කිරීමට කටයුතු කරන්න.

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සහ ප්‍රශ්න හයකින් (6) සමන්විත ය.

යටත් පිරිසෙයින් එක් කොටසකින් **එක්** ප්‍රශ්නයක් බැගින් තෝරාගෙන ප්‍රශ්න **<u>තුනකට (03)</u>** පිළිතුරු සපයන්න.

ප්‍රශ්නවල එක් එක් කොටස සඳහා **උපරිම වචන සංඛ්‍යාව සහ ලකුණු** සඳහන් කර ඇත.

ලෝක ආකෘති සිතියම් දෙකක් සහ චීනයේ සහ නෙදර්ලන්තයේ ආකෘති සිතියමක් බැගින් අමුණා ඇත. අයදුම්කරුට එම සිතියම්වල මුද්‍රිත පිටපත් හෝ දළ සටහන් භාවිත කළ හැකි ය.

<u>1 කොටස</u>

1.

i) චීනයේ විවිධ වර්ගවල නිවාස නම් කරන්න. (වචන 200: ලකුණු 04)

ii) චීනයේ නිවාස ගැටලුවට හේතු කෙටියෙන් සාකච්ඡා කරන්න. (වචන 400: ලකුණු 06)

iii) චීනයේ නිවාස ගැටලුව අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග නිදසුන් සහිතව විමසන්න. (වචන 1000:ලකුණු 10)

2.

i) තිරසාර නගරයක් හඳුනා ගැනීම සඳහා භාවිත කරන නිර්නායක සඳහන් කරන්න. (වචන 200: ලකුණු 04)

ii) නෙදර්ලන්තයේ තිරසාර නගරවල පවතින ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (වචන 400: ලකුණු 06)

iii) සුදුසු උදාහරණ සපයමින් තිරසාර නගර සැලසුම් කිරීමේ දී සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ගැටලු විග්‍රහ කරන්න. (වචන 1000:ලකුණු 10)

3.

i) යුරෝපා සංගමය හඳුන්වන්න. (වචන 200: ලකුණු 04)

ii) අන්තර්ජාතික වෙළඳාමේ දී යුරෝපා සංගමය අත්පත් කරගෙන ඇති වාසි කෙටියෙන් සඳහන් කරන්න. (වචන 400: ලකුණු 06)

iii) අන්තර්ජාතික වෙළඳාමේ දී යුරෝපා සංගමය වර්තමානයේ මුහුණ දෙන අභියෝග නිශ්චිත නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (වචන 1000:ලකුණු 10)

2 කොටස

4.

i) ''දේශගුණික විපර්යාස'' ඔබ අර්ථ දක්වන්නේ කෙසේද?

(වචන 200:ලකුණු 04)

ii) දකුණු ආසියාතික රටවල කෘෂිකර්මාන්තය කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම නිදසුන් සහිතව කෙටියෙන් සාකච්ඡා කරන්න.

(වචන 400:ලකුණු 06)

iii) උදාහරණ සපයමින් සංවර්ධනය වෙමින් පවතින රටවල දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(වචන 1000:ලකුණු 10)

5.

i) ''ජල දරිද්‍රතාව'' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(වචන 200: ලකුණු 04)

ii) ''අප්‍රිකාවේ ජල දරිද්‍රතාවයෙන් වඩාත් අවදානමට ලක්වන කණ්ඩායම වන්නේ කාන්තාවන්ය.'' උචිත නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(වචන 400: ලකුණු 06)

iii) ''ජල දරිද්‍රතාව බොහෝ දුරට තිරණය වන්නේ පාරිසරික සාධකවලට වඩා රටක පවතින මානව සාධක මතය.'' සුදුසු උදාහරණ භාවිත කරමින් මෙම කියමන විවේචනාත්මකව අගයන්න.

(වචන 1000:ලකුණු 10)

6.

i) ''ආදිවාසී ජනයා (indigenous people)'' පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.

(වචන 200: ලකුණු 04)

ii) ''නූතන තාක්ෂණය, නිවර්තන කලාපයේ වෙසෙන ආදිවාසීන්ට තර්ජනයකි'' යන අදහසට ඔබ එකඟ වේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(වචන 400: ලකුණු 06)

iii) පාරිසරික තිරසාරබව රැක ගැනීම උදෙසා ආදිවාසී ජනයාගේ කාර්යභාරය අගයන්න.

(වචන 1000:ලකුණු 10)

==========

GYG 4271
Index No:

THE NETHERLANDS

GYG 4271
Index No:

CHINA



GYG 4271
Index No:

THE WORLD

GYG 4271
Index No:

THE WORLD